සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2019 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2019-07-27
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) ***ප්‍රස්තාර කොළ*** *සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## A කොටස

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** භූමිය භාවිතය වෙනුවෙන් කරන ගෙවීම හඳුන්වන්නේ:

(1) ලාභය ලෙසයි. (2) කුලිය ලෙසයි. (3) පොලිය ලෙසයි. (4) වේතන ලෙසයි.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ඉල්ලුම තීරණය කරනු ලබන සාධකයක් (determinant) වන්නේ කුමක් ද?

(1) ආදේශක භාණ්ඩවල මිල ගණන්. (2) පාරිභෝගික ආදායම.

(3) කාලගුණික සාධක. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, කතිපයාධිකාරී (oligopoly) වෙළෙඳපොලක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) සීමිත අලෙවිකරුවන් ගණනක් පමණක් සිටීම.

(2) වෙළෙඳපොලට පිවිසීමට බාධා නොමැති වීම.

(3) නිෂ්පාදිත භාණ්ඩ, සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ වීම.

(4) මිල දැඩියාවක් (rigidity) පැවතීම.

**1.4** නිමැවුමෙහි අතිරේක ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන අමතර පිරිවැය:

(1) ආන්තික පිරිවැය වේ. (2) මුළු පිරිවැය වේ.

(3) සාමාන්‍ය පිරිවැය වේ. (4) විචල්‍ය පිරිවැය වේ.

**1.5** ආයතනයක කෙටිකාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) නිෂ්පාදන සාධක, ස්ථාවර සාධක සහ විචල්‍ය සාධක ලෙස බෙදනු ලබයි.

(2) ස්ථාවර සාධක නොමැත.

(3) පරිමාණානුකූල පිරිමැසුම් මගින් සාමාන්‍ය පිරිවැය වක්‍රය තීර්ණය කරනු ලැබේ.

(4) ආයතනයකට එහි සියලුම යෙදවුම් වෙනස් කිරීමට හැකිය.

**1.6** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 4.4% කි. (2) 6% කි. (3) 3.2% කි. (4) 4.8% කි.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තිවල ගුණාත්මක පාලනයක් වන්නේ කුමක් ද?

(1) ශීර්ෂ පිළිබඳ උපරිම සීමා (portfolio ceilings).

(2) බැංකු පොලී අනුපාත ප්‍රතිපත්තිය (bank rate policy).

(3) විවට වෙළෙඳ කටයුතු (Open market operations).

(4) විචල්‍ය සංචිත අනුපාත ප්‍රතිපත්තිය (Variable reserve ratio policy).

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) රාජ්‍ය ණය කළමනාකරණය. (2) ණය සහ අයිරා පහසුකම් සැලසීම.

(3) විදේශ විනිමය කළමනාකරණය. (4) මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය.

**1.9** ජාතික ආදායම් ප්‍රවාහයේ කාන්දුවීමක් (ගිලිහීමක්) සඳහා උදාහරණයක් වන්නේ:

(1) ආයෝජන. (2) රජයේ වියදම්. (3) අපනයන. (4) ආනයන.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, සාර්ව ආර්ථික විචල්‍යයක් **නොවන්නේ** කුමක් ද?

(1) සමස්ත නිෂ්පාදනය. (2) ගෙවුම් ශේෂය.

(3) සාමාන්‍ය මිල මට්ටම. (4) වෙළෙඳපොළ සමතුලිතතාවය.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** විලම්බිත ගෙවීම් (කල් පසුවූ ගෙවීම්) මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම, මුදලේ කාර්යයක් වේ.

**1.12** මුදලේ විදේශීය මූර්ත අගය (real external value) යනුවෙන් අදහස් කරන්නේ මුදල් ඒකකයකින් දේශීය වෙළෙඳපොළේදී මිලදී ගතහැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණයයි.

**1.13** අත්‍යවශ්‍ය භාණ්ඩයක් සඳහා ඉල්ලුමේ ආදායම් නම්‍යතාව එකට වඩා අඩු වේ.

**1.14** ආයතනයකට එහි සාමාන්‍ය මුළු පිරිවැය පමණක් ආවරණය කරගත හැකි මිල, වසා දැමීමේ මිල (shut down price) ලෙස හඳුන්වනු ලැබේ.

**1.15** ඒකාධිකාරී තරඟයේදී නිෂ්පාදිත, ප්‍රභේදනය සහිත වේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** මිල සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර …………………… *[ප්‍රතිලෝම (ඍණ) / අනුලෝම (ධන)]* සම්බන්ධයක් තිබේ.

**1.17** සාමාන්‍ය නිෂ්පාදිත [Average Product (AP)] වක්‍රයේ …………………… *(අවම / උපරිම)* ලක්ෂ්‍යයේදී ආන්තික නිෂ්පාදිත [Marginal Product (MP)] වක්‍රය, සාමාන්‍ය නිෂ්පාදිත (AP) වක්‍රය ඡේදනය කරයි.

**1.18** භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර විකිණීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් සැපයුම …………………… *(වැඩි කළ / අඩු කළ)* හැකිය.

**1.19** රජය මගින් කරනු ලබන …………………… *(වර්තන / ප්‍රාග්ධන)* වියදම් සඳහා උදාහරණයක් වන්නේ මූර්ත වත්කම් අත්පත් කර ගැනීමයි.

**1.20** රටක ව්‍යුහමය වෙනස සඳහා උපකාර කෙරෙන තීරණාත්මක සාධකයක් වන්නේ …………………… *[තාක්ෂණික සංවර්ධනයයි (Technological development) / උද්ධමනයයි (Inflation)]*.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) (i) ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් (නිෂ්පාදන සාධක) හතර(04) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(ii) ඉහත ඒවා අතුරින් ඕනෑම දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(b) ආර්ථිකයක, මූලික ආර්ථික ප්‍රශ්න තුනක් තිබේ. ඒවා නම්, නිෂ්පාදනය කළ යුත්තේ කා සඳහා ද?, කුමක්, කොපමණ ප්‍රමාණයකින් නිෂ්පාදනය කළ යුතු ද? සහ කෙසේ නිෂ්පාදනය කළ යුතු ද ? යන්නයි.

වෙළෙඳපොළ (ධනවාදී) ආර්ථික ක්‍රමය මගින් සහ සැලසුම්ගත (සමාජවාදී) ආර්ථික ක්‍රමය මගින් ඉහත එක් එක් මූලික ආර්ථික ප්‍රශ්නය විසඳනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සඳහා පහත සඳහන් ඉල්ලුම් (Qd) සහ සැපයුම් (Qs) සමීකරණ ඔබ වෙත දී ඇත:

$$Qd = 400 - 2P$$

$$Qs = -100 + 3P$$

(i) භාණ්ඩයේ සමතුලිත මිල **ගණනය කරන්න.** (ලකුණු 02)

(ii) භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 01)

(b) (i) ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයිදැයි යන්නට හේතුවක් **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(ii) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය යන සංකල්ප ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) (i) අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රභවයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) රාජ්‍ය ව්‍යවසායයන්හි වාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) මුදලට ඇති ඉල්ලුම සඳහා වන චේතනා (motives for demand for money) තුන(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

සම්පත් ඒකකයක් භාවිත කරමින් පකිස්ථානය සහ ඉන්දියාව මගින් නිෂ්පාදනය කළ ලොකු එනු සහ සුදු එනු කිලෝග්‍රෑම් ප්‍රමාණ පහත වගුවේ පෙන්වා ඇත:

| රට | ලොකු එනු (කිලෝග්‍රෑම්) | සුදු එනු (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| පකිස්ථානය | 24 | 12 |
| ඉන්දියාව | 4 | 8 |

(a) (i) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසිය (absolute advantage) ඇත්තේ කුමන රටටදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසිය (comparative advantage) ඇත්තේ කුමන රටටදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ජාත්‍යන්තර වෙළඳාමේ වාසි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) (a) 2019 අප්‍රේල් 21 දින සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් (පාස්කු ඉරිදා ප්‍රහාරය) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇතිවූ ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) වක්‍ර බදුවල අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(B) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර කර්මාන්තය | 3,000 |
| නිෂ්පාදන කර්මාන්ත, පතල් හා කැණීම් සහ වෙනත් කර්මාන්ත | 2,600 |
| ඉදිකිරීම් | 2,000 |
| තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, ගබඩා කිරීම, නවාතැන් සැපයීම් හා ආහාර සැපයීම් සේවා | 4,500 |
| තොරතුරු සහ සන්නිවේදනය | 2,000 |
| මූල්‍ය සහ රක්ෂණ කටයුතු | 2,500 |
| නිවාස අයිතිය ඇතුළුව දේපළ වෙළඳාම | 1,200 |
| වෘත්තිය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම් | 2,000 |
| රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපන, මානව සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 10,500 |
| නිෂ්පාදිත මත බදු | 1,500 |
| නිෂ්පාදිත මත සහනාධාර | 1,000 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිලට දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(C) ජාතික ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම සඳහා හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |